SUMMIT
FINANCE PLC
Taking you to the top

නගර ශාඛාව, **15,** දුම්රියපොළ පාර ,කොළඹ **03.**
දුර: **+94 11 2375408-12** ෆැක්ස් : **+94 11 2375411**
ඊ-මේල් : **info@summit.lk** වෙබ් : **www.summit.lk**

මූල්‍ය ප්‍රකාශන

EY
Building a better working world

Ernst & Young
Chartered Accountants
201 De Saram Place
P.O. Box 101
Colombo 10
Sri Lanka

Tel : + 94 11 2463500
Fax Gen : + 94 11 2697369
Tax : + 94 11 5578180
eysl@lk.ey.com
ey.com

AL/PATR/AD

ස්වාධීන විගණක වාර්තාව
සමිට් ෆිනෑන්ස් පී.එල්.සී. හි කොටස් හිමියන් වෙනුවෙන් සම්පාදිතයි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වාර්තාව

මේ සමග ඉදිරිපත් කොට ඇති සමිට් ෆිනෑන්ස් පීඑල්සී (සමාගම) හි මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලද අතර 2016 මාර්තු මස 31 වැනි දින වන විට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ඊට අන්තර්ගත වේ. එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය සංසරණය පිළිබඳ ප්‍රකාශනය ද ඇතුළත් වේ. ඊට අමතර ව, මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන් පිටු අංක 07 සහ 50 සඳහන් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූල ලෙස මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලයට පැවරේ. වංචාවක් නිසා හෝ වරදක් නිසා හෝ ප්‍රත්‍යක්ෂ අවප්‍රකාශන සඳහා ඉඩ නොතබමින්, මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන කටයුතු නිවැරදි ආකාරයෙන් කරගෙන යාම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීමයි.

විගණකගේ වගකීම

අපගේ විගණනයන් මත පදනම් වී මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිගමන ඉදිරිපත් කිරීම අපගේ වගකීමයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල වන ලෙසින් අපි අපගේ විගණන කටයුතු සිදුකළෙමු. අදාළ මූල්‍ය ප්‍රකාශන ප්‍රත්‍යක්ෂ අවප්‍රකාශනවලින් නිදහස් බවට සාධාරණ සහතිකයක් ලබා ගැනීමට හැකි වන පරිදි අප අපගේ විගණනය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රමිතීන් යටතේ අවශ්‍ය වන කරුණකි. පරීක්ෂණ පාදක කර ගත් විභාග කිරීම්, මූල්‍ය අගයයන් සනාථ කෙරෙන සාක්ෂි සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ අනාවරණ කිරීම් ආර්ථයෙන් විගණනය සමන්විත වෙයි.

මූල්‍ය ප්‍රකාශණයට අනුව මූල්‍යමය තත්ත්වය සහ අන්තර්ගතය පිළිබඳ දැක්ත විශ්ලේෂණය කිරීමේ ක්‍රියාමාර්ගය විගණනය මඟින් සිදු කෙරේ. එම ක්‍රියාවලියට අනුව මූල්‍ය ප්‍රකාශන ප්‍රත්‍යක්ෂ අවප්‍රකාශ වල අවදානම තක්සේරු කරමින් කිසියම් දෝෂයක් හෝ වරදක් ඇති බව විනිශ්චය කිරීම විගණක මත රඳා පවතී. එම අවදානම තක්සේරු කිරීමදී විගණක විසින් නිවැරදි විගණන ක්‍රියා පටිපාටිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශය සකස් කිරීම සමාගමේ අභ්‍යන්තර සංකීර්ණ කාර්යයේ සවිලතාව සහ පාලනය නිවැරදි අදහස් ලබාගැනීම හේතු වේ. කළමනාකාරීත්වය විසින් කරන ලද වැදගත් තක්සේරු කිරීම් සහ භාවිත කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇගැයීම මෙන්ම සමස්ත මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කර ඇති ආකාරය විශ්ලේෂණය කිරීම ද විගණනයට අදාළ වේ.

අපගේ විගණන කාර්යය සඳහා අවශ්‍ය වන තොරතුරු සහ පැහැදිලි කිරීම් රැස්කර ගැනීම අපගේ දැනුමේ සහ විශ්වාසයේ උපරිම අර්ථයෙන් සිදුකර ඇත්තෙමු. එබැවින් අපගේ නිගමනය සඳහා සාධාරණ පදනමක් විගණනය තුළින් අප වෙත ලැබෙන බව අපි විශ්වාස කරන්නෙමු.

නිගමනය

2016 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ ගිණුම් වර්ෂයේදී සමාගමේ මූල්‍ය ප්‍රකාශනය මඟින් සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සැබෑ සහ සාධාරණ අදහසක් ගෙන දෙයි. ඊට අමතරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල ලෙසින් එහි මූල්‍ය කාර්යය සාධනය සහ මූල්‍ය ගලනය වසර තුළ සිදුවී ඇත.

වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ කාණ්ඩ 163 (2) කොටස යටතේ අප පවසනු ලබන්නේ

a) නිගමනයේ පදනම, විගණනයේ විෂය පථය සහ සීමාව ඉහතින් සඳහන් කළ පරිදි වේ.

b) අපගේ නිගමනය

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම අප ලබාගත් අතර අපගේ පරීක්ෂණ විභාග කිරීම් මඟින් මෙම සමාගම නිසි පරිදි ගිණුම් වාර්තා තබාගෙන ඇති බව සහ

- ඊට අමතරව , ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2007 අංක 07 දරන සමාගම් පනතේ කාණ්ඩ 151 හි අවශ්‍යතා සමඟ මෙම මූල්‍ය ප්‍රකාශන ගැලපේ.

Ernst & Young

2016 මැයි 30 කොළඹ

Partners: WRH Fernando FCA FCMA M P D Cooray FCA FCMA R N de Saram ACA FCMA Ms. N A De Silva FCA Ms. Y A De Silva FCA W K B S P Fernando FCA FCMA Ms. L K H L Fonseka FCA A P A Gunasekara FCA FCMA A Herath FCA D K Hulangamuwa FCA FCMA LLB (Lond) H M A Jayesinghe FCA FCMA Ms. A A Ludowyke FCA FCMA Ms. G G S Manathunga FCA N M Sulaiman ACA ACMA B E Wijesuriya FCA FCMA

A member firm of Ernst & Young Global Limited

විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය
2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය

	2016 Rs.	2015 Rs.
පොලී ආදායම	289,589,051	289,636,782
පොලී වියදම	(125,889,086)	(131,142,196)
ශුද්ධ පොලී ආදායම	163,699,965	158,494,586
කුලී සහ කොමිස් ආදායම	4,364,084	3,172,420
කුලී සහ කොමිස් වියදම	-	-
ශුද්ධ කුලී සහ කොමිස් ආදායම්	4,364,084	3,172,420
වෙළඳාමෙන් ලැබූ දළ ප්‍රතිලාභය / (අලාභය)	(656)	1,391,254
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	2,960,030	1,140,294
සමස්ත මෙහෙයුම් ආදායම්	171,023,423	164,198,554
බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම	(11,813,583)	(116,444,776)
ශුද්ධ මෙහෙයුම් ආදායම්	159,209,840	47,753,778
මෙහෙයුම් වියදම්		
සේවක මණ්ඩල පිරිවැය	(43,370,859)	(41,037,310)
දේපළ පිරියත හා උපකරණ ක්ෂය වීම	(7,938,976)	(8,170,769)
අස්පෘශ්‍ය වත්කම් අගය ක්ෂය වීම	(793,854)	(791,685)
වෙනත් මෙහෙයුම් වියදම්	(60,351,189)	(70,639,813)
මූල්‍ය සේවා මත VAT බදු පැනවීමට පෙර ලාභය/ (අලාභය)	46,754,962	(72,885,799)
මූල්‍ය සේවා මත පැනවුණු VAT බදු	(8,332,942)	-
බදු පැනවීමට පෙර මෙහෙයුම්වලින් ලබන ලාභ (ආලාභ)	38,422,020	(72,885,799)
ආදායම් බදු සඳහා වෙන්කිරීම්	(3,456,047)	28,145,030
වර්ෂය තුළ ලාභය / (අලාභය)	**34,965,973**	**(44,740,769)**
සෙසු විස්තීරණ ආදායම් / (වියදම්)		
සෙසු විස්තීරණ ආදායම් / (වියදම්) ලාභ හෝ අලාභ ලෙස වර්ග කළ නොහැකි		
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වූ වර්ධිත ප්‍රතිලාභ (අලාභ)	440,903	(244,814)
වර්ෂය සඳහා වන වෙනත් විස්තීරණ ආදායම් /(වියදම්) බදු අඩු කිරීමෙන් පසු	440,903	(244,814)
වර්ෂය සඳහා වන සමස්ත විස්තීරණ ආදායම් / (වියදම්)	**35,406,876**	**(44,985,583)**
කොටසක් සඳහා වන ඉපැයුම් (රු)	1.55	(1.99)

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
2016 මාර්තු 31 වෙනි දින වන විට

	2016 Rs.	2015 Rs.
වත්කම්		
මුදල් සහ මූල්‍ය තුල්‍යතාවයන්	75,829,061	55,332,422
මුදල් ආයෝජන - වෙළෙඳාමට නියමිත	700	1,356
ණය සහ අත්තිකාරම්	1,037,098,925	660,344,346
අයවිය යුතු කල්බදු හා කුලී සින්නක්කර	132,126,602	193,936,429
මූල්‍ය ආයෝජන - විකිණීමට නියමිත	56,300	56,300
මූල්‍ය ආයෝජන - කල් පිරීමට නියමිත	72,294,832	20,989,927
මූල්‍ය ආයෝජන	16,602,880	62,917,381
වෙනත් මූල්‍ය වත්කම්	83,843,230	292,286,542
තොගය - දේපළ වෙළඳාම්	2,607,728	8,031,216
වෙනත් මූල්‍ය නොවන වත්කම්	17,850,907	16,194,439
දේපොළ, පිරියත සහ උපකරණ	22,272,282	16,904,913
අස්පෘශ්‍ය වත්කම්	1,647,606	2,441,461
විලම්බිත බදු වත්කම්	27,652,283	28,567,521
සමස්ත වත්කම්	**1,489,883,336**	**1,358,004,253**
වගකීම්		
බැංකු සඳහා ගෙවිය යුතු මුදල	47,225,971	10,691,213
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුදල	1,105,657,981	1,034,978,467
ගෙවිය යුතු වෙනත් මූල්‍යමය වගකීම්	1,614,474	2,803,084
ගෙවිය යුතු වෙනත් මූල්‍යමය නොවන වගකීම්	14,646,113	24,407,942
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	1,556,138	1,347,764
සමස්ත වගකීම්	**1,170,700,677**	**1,074,228,470**
කොටස් හිමියන්ගේ අරමුදල්		
ප්‍රකාශ කොට ඇති ප්‍රාග්ධනය	225,000,000	225,000,000
ආදායම් සංචිත	86,272,137	52,613,560
වෙනත් සංචිත	7,910,522	6,162,223
කොටස්කරුවන්ගේ සමස්ත අරමුදල	**319,182,659**	**283,775,783**
සමස්ත වගකීම් සහ කොටස්කරුවන්ගේ අරමුදල්	**1,489,883,336**	**1,358,004,253**
බැඳීම් සහ අවිනිශ්චිත වගකීම්	15,186,566	188,977,816
කොටසකට ශුද්ධ වත්කම (රු.)	14.19	12.61

2007 වර්ෂයේ අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූල ලෙස මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට තිබේ.

.....
අයි එම් චන්දන බණ්ඩාර
මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය වග වනු ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබනු ලැබුවේ,

.....
පී.සී.ඒ.ද සිල්වා
කළමනාකාර අධ්‍යක්ෂක

.....
එච් ඩී කරුණාරත්න
අධ්‍යක්ෂ

2016 මැයි 30,
කොළඹ